සතියේ දින වල දිවයින පුවත්පතේ නිතිපතා පළවන "අබ්ලික් ස්ටෝරි" යන කොලමෙහි, "අනේ! තාත්තේ එපා..." යන සිරස්තලයෙන් යුතුව පළව තිබූ කතාන්තරයකි (07/12).
මෙම කොලමෙහි මෙම කතාන්තරය පුරාවටම භාවාතිෂය ආකාරයකින් ඉදිරිපත් කොට ඇත්තේ, අදාළ බාලවයස්කාර වින්දිතයා "විනාශ වූ" බව මෙන්ම ඇගේ ජීවිතය "කාලකණ්ණි වූ" බවයි.
ලිංගික අපරාධයක වින්දිතයෙකුගේ ජීවිතය එයින් පසු "කාලකණ්ණි" වන්නේ යැයි පැවසීම ඔස්සේ මාධ්‍යයක් සමාජයට ලබාදෙන ආදර්ශය කුමක්ද? ලිංගික අපරාධයකට මුහුණ පානා වින්දිතයෙකුට වුවත්, එතැනින් එහාට තමන්ගේ අධ්‍යාපනය ඉදිරියට ගෙන යන්නට, ජීවිතය ගොඩනගාගන්නට අයිතියක් නැතිද?
දිනෙන් දින වඩ වඩාත් භාවාතිෂය ආකාරයෙන් ලියැවෙන, ආචාර ධාර්මික සීමාවන් වඩ වඩාත් උල්ලංඝනය කරන මෙවැනි කොලම් සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #sinhalanews #Divaina